**ශීර්ෂය 153 - ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදි. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත.මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටුකිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 153 - ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාල පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 06 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණ වලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.9 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත්බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරු වන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලසුම් කළ යුතු වීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව පිළියෙල කර නොතිබුණි. | 2.1.1 (අ) |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලසුම් නොකිරීම. | 2.1.1 (ආ) |
| | | 3. අපේක්ෂිත ඉලක්ක පහත හෙලීම. | 2.1.1 (ඇ) |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. කළමනාකරණ දුර්වලතා | 2.5 |
| | | 2. අනුකූල නොවීම් | 2.9 |

| | | | |
|---|---|---|---|
| 127 (2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. ප්‍රගතියක් ලබා නොමැති ව්‍යාපෘති<br>2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.1.2<br>2.2.1 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියාකල හැකිවන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමාවෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගන්නා ලද ඌනතා හා අතිරික්තතා<br>2. බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්<br>3. වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම.<br>4. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම. | 2.3 (අ)<br>2.3(ආ)<br>2.3 (ඇ)<br>2.8 |
| 127 (4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධි වූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරික්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම | 2.4 |
| 127 (5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව. | සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම. | 2.6 |

| | | | |
|---|---|---|---|
| 127 (6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම. | හිඟ ණය ශේෂ අයකර නොගැනීම. | 2.7 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---------------------------------------------------

**2.1 කාර්යසාධනය**

-----------------

**2.1.1 සැලසුම් කිරීම**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්මෙහි අපේක්ෂිත ප්‍රතිඵල දැක්විය යුතු වුවද, අමාත්‍යාංශයේ ප්‍රධාන ක්‍රියාකාරකමක් යටතට ගැනෙන බිම්සවිය වැඩසටහනෙහි අපේක්ෂිත ප්‍රතිඵල ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහාවූ අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. එසේම ප්‍රසම්පාදන සැලැස්ම වාර්ෂික ඇස්තමේන්තුවට අනුකූලව සකස් කිරීම සිදුකර නොතිබුණු බවද නිරීක්ෂණය විය.

(ඇ) වසර 05 ක බිම්සවිය වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ප්‍රතිපාදනය | වියදම | ඉලක්කගත හිමිකම් සහතික ප්‍රමාණය | මැනුම් කරන ලද කැබලි සංඛ්‍යාව | නිර්දේශ කර අනුමත කරන ලද කැබලි සංඛ්‍යාව | තීරණය ප්‍රසිද්ධ කළ/ ගැසට් කළ ඉඩම් කැබලි සංඛ්‍යාව | පුද්ගලයින් විසින් ලබාගෙන ඇති හිමිකම් සහතික ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | | | | | |
| 2013 | 800 | 668 | 135,000 | 110,630 | 71,315 | 58,690 | 28,402 |
| 2014 | 400 | 445 | 122,090 | 122,239 | 53,448 | 66,759 | 24,242 |
| 2015 | 546 | 413 | 206,580 | 83,957 | 51,475 | 53,484 | 29,043 |
| 2016 | 500 | 362.6 | 45,000 | 133,727 | 60,830 | 59,880 | 21,872 |
| 2017 | 400 | 256.6 | 48,000 | 105,395 | 59,672 | 56,377 | 20,151 |

2013, 2014 සහ 2015 වර්ෂයන්ට සාපේක්ෂව 2016 සහ 2017 වර්ෂවලදී ලඟාකර ගත යුතු ඉලක්කයන් තුන් ගුණයකින් පහත වැටී ඇති බව නිරීක්ෂණය විය. එසේම තීරණ ප්‍රසිද්ධ කළ ඉඩම් කැබලි සංඛ්‍යාව කුමන වර්ෂයන්ට අදාලව ද යන්න පිළිබඳව වාර්තා තබා ගැනීමක් සිදු කර නොතිබුණි.

### 2.1.2 ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

-----------------------------------------

(අ) ඉඩම් බැංකුවට අදාල ක්‍රියාකාරී සැලැස්ම යටතේ E- Land Registry වැඩසටහන ක්‍රියාත්මක කිරීම, E – Slims වැඩසටහන ක්‍රියාත්මක කිරීම, ඉඩම් අත්පත් අංශය සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම, E- LandHub යටතේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, ඉඩම් හිමිකම් නිරවුල් කිරිමේ දෙපාර්තමේන්තුවේ සහ ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය වැඩිදියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම අරමුණු කරගෙන 2017 වර්ෂයේදී රු.395,000,000 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි. එම ප්‍රතිපාදනයෙන් සියයට 29 ක් හෙවත් රු.116,459,504 ක් පමණක් වැයකර, රු.278,540,496 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) E- Land Registry වැඩසටහන යටතේ කාර්යාල 22 ක පත්තිරු පරිලෝකනය කර පරිගණකගත කිරීමට සැලසුම් කර තිබුණද, කාර්යාල 15 ක පමණක් ලේඛන පරිගණකගත කර තිබුණි. 2016 වර්ෂයේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැකි මට්ටමේ පවතින කාර්යාල 6 ක් පැවති නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විට දත්ත පරිගණක ගත කිරීමේ කටයුතු නිසියාකාරව සිදුනොවීම හේතුවෙන් එම කාර්යාල 06 හිද මෘදුකාංගය යාවත්කාලීන වී නොතිබුණි.

(ii) ඉඩම් අත්පත් අංශය සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සහ E- Land Hub යටතේ ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා වූ ප්‍රතිපාදනද ඉහත ප්‍රතිපාදනය තුළ අන්තර්ගත වී තිබුණද එම කාර්යයන් ඉටුකර නොතිබුණි.

(iii) ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීමට සැලසුම් කර තිබුණද රු.මිලියන 3 ක මුදලක් වැය කරමින් පරිගණක මෘදුකාංගයක් නිපදවීම පමණක් සිදුකර තිබුණි.

(ආ) 1994 වර්ෂයේ සිට වසා තිබූ කන්තලේ සීනි කර්මාන්තායතනය 2015 වර්ෂයේදී ඉඩම් අමාත්‍යාංශය යටතට පවරා තිබුණි. මෙම කර්මාන්තායතනය ආයෝජන සමාගමක් වෙත පැවරීම සඳහා වු කොටස්කාර ගිවිසුම 2016 අගෝස්තු 11 දින අත්සන් කර තිබුණි. එම ගිවිසුම ප්‍රකාරව කර්මාන්ත ශාලා භූමියෙහි පවතින අනෙකුත් දේපළද ආයෝජන සමාගමේ අභිමතය පරිදි පරිහරණය කිරීමට ප්‍රතිපාදන සලසා තිබීම තුළ දේපළ අපහරණය කිරීමට අදාලව නීතිපති මතය විමසා තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් යකඩ සහ අනෙකුත් වත්කම් අපහරණය කිරීමට නීතිපති අනුමැතිය ලබාදී තිබුණද, අදාල අයෝජන සමාගම විසින් කොටස්කාර ගිවිසුම ප්‍රකාරව තම සමාගමට ගොඩනැගිලි සහ යන්ත්‍රෝපකරණ අයත් විය යුතු බව දක්වා තිබුණි. එම නිසා අපහරණ කටයුතු තාවකාලිකව අත් හිටුවීමට හදිසි අතුරු සහනයක් සිංගප්පූරු අන්තර්ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානයක් විසින් ලබාදී ඇති බව ආයෝජකගේ නීති උපදේශක විසින් අමාත්‍යාංශය වෙත දැනුම් දීම මත අපහරණ කටයුතු තාවකාලිකව අත්හිටුවා තිබුණි. මේ අනුව මෙම කර්මාන්තායතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු හා අරමුණු ඉටු වී නොතිබුණි.

**2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබාගැනීම**

**2.2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙල කළයුතු ප්‍රසම්පාදන සැලසුමෙහි ගොඩනැගිලි පුනරුත්ථාපනයට රු.600,000 ක්ද, නිල නිවාස 02 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා රු.350,000 ක්ද වෙන්කර තිබුණු නමුත් එම කාර්යයන් සිදුකර නොතිබුණි.

(ආ) වන්දි සමාලෝචන මණ්ඩලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 මාර්ගෝපදේශයට පටහැනිව ගොඩනැගිල්ල කුලියට ගැනීම සඳහා පුද්ගලයන් තිදෙනෙකු වෙතින් ඍජුවම මිල කැඳවීම් සිදුකර තිබුණි.

(ii) පුවත්පත් දැන්වීම් මගින් මිල කැඳවීම් සිදුකළ යුතු බවට සුළු ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කර තිබුණද, එම තීරණය නොසලකා ඍජුවම වෙනත් සැපයුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද රු.120,000 ක මාසික කුලියක් පදනම් කරගෙන වසර 02 ක කාලයක් සඳහා බදු ගිවිසුමක් සඳහා එළැඹ තිබුණි.

**2.3 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගන්නා ලද ඌනතා 35 ක් සහ අතිරික්තතා 44 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව හඳුනාගෙන කටයුතු කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය විසින් රු.මිලියන 11.40 ක් වටිනා මෝටර් වාහන 02ක් වසර 09 ක කාලයක සිට ද, රු.මිලියන 48.55 ක් වටිනා මෝටර් වාහන 07ක් වසර 04 ක කාලයක සිටද ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත අවිධිමත් ලෙස මුදාහැර තිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

රු.මිලියන 5.00 ක් වටිනා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සතු මෝටර් වාහනයක් වර්ෂයක කාලයක සිටද, රු.මිලියන 5.00 ක් වටිනා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සතු මෝටර් වාහනයක් වසර 4ක කාලයක සිටද විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණි.

## 2.4 බැඳීම් හා බැරකම්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරක්ෂණය කරනු ලැබේ.

මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව යම් සේවයක් හෝ සැපයුමක් සඳහා දරනු ලැබූ වැය ප්‍රමාණය සහ ඒ වෙනුවෙන් දරන ලද බැරකම්, මුදල් වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන නොඉක්මවිය යුතු වුවද වැය විෂයයන් 10 ක් සඳහා රු.279,794 ක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා බැඳී තිබුණි.

## 2.5 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 38(අ) අතුරු විධාන ආඥාව යටතේ අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් කඩිනමින් වන්දි මුදල් ගෙවීමට කටයුතු නොකිරීම හේතුවෙන් ඒ සඳහා පොළිය ද ගෙවීමට සිදුවී තිබුණි. මෙලෙස 2017 වර්ෂයේදී අමාත්‍යාංශයේ සාමූහික ප්‍රතිපාදන මගින් රු.1,993,565,640 ක වන්දි මුදලක් හා රු.402,180,339 ක පොළී මුදලක් නිදහස් කර තිබුණි. පොළී මුදල් ගෙවීමට අදාල කාල විශ්ලේෂණය පහත පරිදි විය.

| අත්කරගත් කාලපරිච්ඡේදය | ගෙවූ වන්දි මුදල | ගෙවූ පොළී මුදල | අත්පත් කරගත් දින සිට වන්දි ගෙවීමට ගතවූ කාලය(අවු.) |
|---|---|---|---|
| | රු. | රු. | |
| 1976 - 1995 | 150,643,912 | 224,982,234 | 22–41 |
| 1996 – 2005 | 133,743,250 | 79,714,580 | 12–21 |
| 2006 - 2015 | 1,709,178,478 | 97,483,525 | 02 - 11 |
| | 1,993,565,640 | 402,180,339 | |

(ආ) අවිස්සාවේල්ල ජල සම්පාදන ක්‍රමයේ ජල තටාකය හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා අක්කර 2 පර්චස් 17.75 ක් අත්පත් කර ගැනීම සඳහා 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීම් පනතේ 38 (අ) වගන්තිය ප්‍රකාර අතුරු විධානය 2004 ජනවාරි 09 දින ගැසට් කර තිබුණි. පනතේ 9 වන වගන්තිය අනුව හිමිකම් පරික්ෂාව පවත්වා අයිතිය තහවුරු කිරීමට 2017 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) වලහන්දුවවත්ත කටුපොල් ඉඩමෙන් හෙක්ටයාර් 2.33 ක් අත්පත් කරගැනීමට අදාලව ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වගන්තිය යටතේ දැන්වීම, 2006 අප්‍රේල් 18 දින පල කර තිබුණ ද අදාල ඉඩම් සඳහා හිමිකම් සනාථ කිරීමේ පරීක්ෂණය 2017 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොතිබුණි.

(ඇ) ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොහිලවගුරවත්ත ඉඩමින් අක්කර 190 ක් කිරි ගොවි ගම්මාන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කර ගෙන තිබුණි. නමුත් යෝජනා කළ කිරි ගම්මාන ව්‍යාපෘතියට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම නිසා එම ඉඩම 2011 ජනවාරි 31 දින කෘෂිකාර්මික ගොවිපලක් පවත්වා ගෙනයාම සඳහා යුධ හමුදාවට පැවරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව 2007 වර්ෂයේ සිට එම ඉඩම වර්ෂ 03 ක් නිෂ්කාර්යව පැවතුණි. එසේම 38(අ) අතුරු විධානය පලකර වසර 10 ක් ඉකුත්ව තිබියදීත් පනතේ 9 වන වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණ පවත්වා වන්දි මුදල් ගෙවීමට 2017 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඉ) නිට්ටඹුව නගරය සංවර්ධනය සඳහා 38(අ) අතුරු විධාන ආඥාව යටතේ 1996 දෙසැම්බර් 19 දිනදී අත්කරගෙන තිබුණු අක්කර 4 පර්චස් 21.6 කින් යුක්ත වූ දම්බොක්ක කුඹුර නමැති ඉඩමෙහි කැබලි අංක 26 සහ 27 සඳහා 2016 වර්ෂයේදී වන්දි ලෙස රු.4,764,000 ක්ද, පොළිය ලෙස රු.6,566,663 ක්ද ගෙවා තිබීමෙන් වන්දි මුදලට වඩා පොළිය වැඩියෙන් ගෙවීමට සිදු වී ඇති බව නිරීක්‍ෂණය විය. ඉඩම් අත්කරගැනීමේ නිලධාරීන් මගින් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට අදාල කටයුතු ප්‍රමාදයකින් තොරව ඉටුකරවා ගැනීමට නිශ්චිත ක්‍රමවේදයක් සකසා නොතිබීම සහ පසු විපරම් ක්‍රියාවලියක් සිදු නොකිරීම හේතුවෙන් මෙලෙස පොලි මුදල් ගෙවීමට සිදු වී තිබුණි.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ 05 ක කාලයක් තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 152.43 | 151.78 | 0.65 | 0.43 |
| | මූලධන | 2,517.75 | 1,976.80 | 540.95 | 21.49 |
| | **එකතුව** | **2,670.18** | **2,128.58** | **541.60** | **20.28** |
| 2014 | පුනරාවර්තන | 236.65 | 233.56 | 3.09 | 1.30 |
| | මූලධන | 2,443.50 | 2,374.84 | 68.66 | 2.81 |
| | **එකතුව** | **2,680.15** | **2,608.40** | **71.75** | **2.78** |
| 2015 | පුනරාවර්තන | 282.52 | 270.31 | 12.21 | 4.32 |
| | මූලධන | 3,109.27 | 2,619.95 | 489.32 | 15.74 |
| | **එකතුව** | **3,391.79** | **2,890.26** | **501.53** | **14.79** |
| 2016 | පුනරාවර්තන | 307.11 | 290.85 | 16.26 | 5.29 |
| | මූලධන | 3,175.32 | 2,001.87 | 1,173.45 | 36.96 |
| | **එකතුව** | **3,482.43** | **2,292.72** | **1,189.71** | **34.16** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2017 | පුනරාවර්ථන | 308.97 | 304.96 | 4.01 | 1.30 |
| | මූලධන | 3,161.05 | 1,768.46 | 1392.59 | 44.05 |
| | **එකතුව** | **3,470.02** | **2,073.42** | **1,396.60** | **40.25** |

**සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය නොකිරීම**

**-----------------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 අගෝස්තු 02 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2016 හි 4.1 ඡේදය අනුව ඇස්තමේන්තු සකස් කිරීමේදී එකිනෙක පිරිවැය ඒකකයට අදාලවන ක්‍රියාකාරකම් නිශ්චිතව හඳුනාගැනීම, සම්පත් අවශ්‍යතාවය සහ සම්පත් පිරිවැය විශ්ලේෂණය, නිමැවුම හෝ ප්‍රතිඵල හඳුනාගැනීම සහ ඇස්තමේන්තුගත පිරිවැයෙහි ප්‍රශස්ත බව පිළිබඳව තහවුරු කර ගැනීම යන පියවරයන් අනුගමනය නොකිරීම නිසා බිම්සවිය වැඩසටහන සඳහා වූ රු.400,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.256,664,753 ක වියදමක් එනම් සියයට 64 ක් පමණක් වැයකර රු.143,335,248 ක මුදලක් ඉතිරි කර තිබුණි.

(ආ) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සලසා තිබුණු රු.500,000 ක ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 09 ක් සඳහා එකතුව රු.මිලියන 1,319.8 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 1,750.6 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 71 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 2.7 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

**------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සිමාවන්**

**------------------------------------------------**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 15301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 17.00 | 14.97 | 7.50 | 9.11 | 43.22 | 43.21 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව, ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.98,728 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 02 ක සිට වර්ෂ 12 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත් එම ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 2.8 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් බැරකම් ලේඛනය පවත්වා නොතිබුණු අතර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | මුදල් රෙගුලාසිය |
|---|---|---|
| (අ) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

## 2.9 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 104 (4) | වාහන අනතුරු 11 ක් සම්බන්ධයෙන් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වාර්තා 2018 මාර්තු 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | වෙනත් චක්‍රලේඛ | |
| | 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති චක්‍රලේඛය | අමාත්‍ය කාර්ය මණ්ඩලය විසින් අනුමත ප්‍රමාණයට වඩා වැඩියෙන් වාහන 02 ක් භාවිතා කර තිබුණි. |

## 2.10 මානව සම්පත් කළමනාකරණය

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 251.65 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.526,462 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 25 | 22 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 447 | 408 | 39 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 52 | 45 | 07 |
| | එකතුව | 528 | 478 | 50 |